# 2026-2027 Mitsubishi Asian Children's Enikki Festa

## ඇතුලත්වීමේ කොන්දේසි

**සංවිධායකයින්**

මිට්සුබිෂි පොදු කටයුතු කමිටුව

ආසියා ශාන්තිකර කලාපයේ යුනෙස්කෝ සමාජ හා සංගම් සදහා වූ ෆෙඩරේෂනය

ජපානයේ යුනෙස්කෝ සංගම් සදහා වූ ජාතික ෆෙඩරේෂනය

**දේශීය සංවිධානය**

(ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව)

**සහාය**

යුනෙස්කෝ සංවිධානය(තාවකාලික)

ජපානයේ විදේශ කටයුතු අමාත්‍යංශය

අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණික අමාත්‍යංශය, ජපානය.

**සහභාගී වන රාජ්‍යයන් හා කලාප(තාවකාලික)**

බංගලාදේශය,භූතානය,බෲනායි, දරුසලාම්, කාම්බෝජය ,චීනය ,ඉන්දියා ,ඉන්දුනීසියාව ,කසකස්තානය,ප්‍රජාතන්ත්‍රවාදී කොරියානු සමුහාණ්ඩුව , ලාඕසය , මැලේසියාව , මාලදිවයින , මොන්ගෝලියාව , මියන්මාරය ,නේපාලය ,පකිස්තානය, පිලිපීනය,සිංගප්පුරුව , ශ්‍රී ලංකාව , චීන තායිපේ , තායිලන්තය , ටිමෝරය , වියෙට්නාමය හා ජපානය

මෙම චිත්‍ර තරගයෙන් නිර්මාණ කරන විස්තරාත්මක දින පොත් තුලින් ලෝකයේ දරුවන් සඳහා ආසියානු ළමයින්ගේ දෛනික ජීවිතය පිලිබ දැන ගැනීමට අවස්ථාවක් සලසා දෙයි. ආසියාවේ විවිධ රටවල් හා කලාප 24 ක දරුවන් සඳහා "මට ආසියාවේ සිටින සියලු දෙනා සමඟ බෙදා ගැනීමට අවශ්‍ය මගේ ජීවිතය" තේමා කර ගනිමින් විස්තරාත්මක දින පොත් නිර්මාණය කිරීමට අප ආරාධනා කරමු. ඔබගේ දෛනික ජීවිතයේ දින තුනක් පිළිබිඹු කරමින් නිර්මාණය කරන විස්තරාත්මක දින පොත් ප්‍රදර්ශනය සඳහා ඔබ සහභාගී නොවන්නේ ඇයි ? ඔබගේ ජීවිතයේ සතුටුදායක අවස්ථාවක් පිලිබඳව ආසියාතික මිතුරන්ට දැන ගැනීමට සලස්වන්න.

## 1. උත්සව කාලසටහන

(1) ඇතුලත්වීමේ කාලය, 2026 අගෝස්තු මස 15 සිට 2026 ඔක්තෝම්බර් මස 31 දක්වා (තාවකාලික )

(2) ජාතික වශයෙන් විනිශ්චය : 2026 නොවැම්බර් (තාවකාලික )

(3) ජාත්‍යන්තර තිරගත කිරීම අප්‍රෙල් 2027 (තාවකාලික ) (ජපානය )

(4) සම්මාන උළෙල සහ සංස්කෘතික හුවමාරු වැඩසටහන : ජූලි -අගෝස්තු 2027 (ටෝකියෝ)

## 2. ඇතුලත්වීමේ සුදුසුකම්

**(1)ප්‍රමාණය**

සෑම චිත්‍ර නිර්මාණයක්ම ඔබේ දෛයිනික ජීවිතයේ සිදුවීමක් විය යුතු අතර එය චිත්‍රයට නගා ඒ පිළිබඳ කෙටි විස්තරයක් ද සමන්විය යුතුය.(මේ සඳහා සායම්, පාට පැන්සල්,ක්‍රෙයෝන්, හා වෙනත් මාධ්‍යක් සමග චිත්‍ර අඳින කඩදාසි භාවිතා කළ හැක.)

**එනික්කි" (නිදර්ශන දිනපොත) යනු කුමක්ද?**

ජපානයේ, එදිනෙදා සිදුවීම් සහ සිතුවිලි පින්තූරයක් සහ කෙටි රචනාවක් ලෙස නිරූපණය කරන "එනික්කි" ( රූප සටහන් දිනපොත් ) නිර්මාණය කිරීමේ සිරිත අපට තිබේ. "එනික්කි" තුළ කතුවරයා ඇය හෝ ඔහු දුටු, ඇසූ, කළ හෝ සිතූ දේවල් ගැන ලියනවා පමණක් නොව, ඇයගේ හෝ ඔහුගේ පොහොසත් මනුෂ්‍යත්වය සහ සංවේදී බව විස්තර කරයි. පින්තූරවලට භාෂා සහ සාක්ෂරතා සීමාවන් ඉක්මවා යා හැකි බැවින්, "එනික්කි" හරස් සංස්කෘතික අවබෝධය සඳහා ඉතා ඵලදායී මාධ්‍යයක් විය හැකිය.




2024-2025 ෆෙස්ටා හි ජපානයේ ග්‍රෑන්ඩ් ප්‍රයිස් ජයග්‍රාහකයා වන සවාකා ඉෂිබාෂිගේ එනික්කි වලින් එකක්..

**(3) සුදුසුකම් නිර්ණායක**

<u>ඇතුළත් වන විට වයස අවුරුදු 6-12 ළමුන්</u>

**(4) ඇතුළත් වීමේ කාලය**

2026 අගෝස්තු මස 15 සිට 2026 ඔක්තෝම්බර් මස 31 දක්වා

**(5) ආකෘතිය**

ප්‍රමාණය -මි.මි. 297 x මි.මි. 210 (ඒ 4 ප්‍රමාණය) චිත්‍රය ඇඳීමේ දි කඩදාසිය දිග අතට භාවිතා කළ යුතු අතර සම්පූර්ණ කඩදාසියෙන් 2/3 ක් චිත්‍රයද 1/3ක් රචනය සඳහා ද වෙන් කළ යුතුය. රචනය පේළි 03 සිට 05 අතර විය යුතුය.

කරුණාකර පිටුපස පිටුව භාවිතා නොකරන්න.




**(6) ඇතුල්වීමේ ක්‍රියාපටිපාටිය**

a) ඇතුල්වන්නාගේ නම චිත්‍ර තුනේම පිටුපස සඳහන් කළ යුතු අතර, එම පිටු තුනම පිටුපස 1 සිට 3 දක්වා අනුපිළිවෙලින් අංක කළ යුතුය. චිත්‍ර තුනම සහ ඇතුළත් වන්නා විසින්ම පුරවන ලද ප්‍රවේශ පත්‍රය එකම ලියුම් කවරයක දමා එවිය යුතුයි.

b) කරුණාකර ගම්, ස්ටේප්ලර්, ලැමිනේටින් භාවිතා නොකල යුතුය.

**(7) අයදුම් කිරීමේ නිර්ණායක**

**1) අයදුම්කරුගේ නිර්මාණ සෑම අර්ථයකින්ම මුල් කලා කෘති විය යුතු අතර කිසිදු වාර්තාවක් ප්‍රසිද්ධියට පත් නොවිය යුතුය. වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ ප්‍රකාශන හිමිකම උල්ලංඝනය කළ හැකි හෝ Enikki හි ප්‍රභවය ප්‍රතික්ෂේප කළ හැකි පහත සඳහන් දේ ඇතුළත් නම් ඇතුළත්වීම ප්‍රතික්ෂේප විය හැක;**

**අ) පින්තූර, කාටූන්, වාක්‍ය සහ යනාදී ඕනෑම පිටපතක් හෝ ප්‍රතිනිෂ්පාදනයක්.**

**ආ) වෙළඳ ලකුණු සහ/හෝ ආලේඛ්‍ය අයිතීන් උල්ලංඝනය කළ හැකි ඕනෑම දෙයකින් පිටපත් කිරීම.**

**ඇ) පුවත්පත්, සඟරා සහ වෙළඳ දැන්වීම් වැනි මුද්‍රිත මාධ්‍ය වලින් පිටපත් කිරීම.**

**2) අයදුම්කරුගේ කායී අතින් නිර්මාණය කළ යුතුය, එනම් පින්තූරය ඇඳීම හෝ පින්තාරු කළ යුත්තේ ඇතුළත් වන්නා විසින්ම / තමා විසින්ම විය යුතු අතර රචනය ඇතුළත් වන්නා විසින්ම / තමා විසින්ම ලිවිය යුතුය. ඕනෑම ඩිජිටල් කලා කෘති හෝ ටයිප් කරන ලද හෝ වචනයෙන් සැකසූ රචනා නුසුදුසු වනු ඇත.**

**(8) සම්මාන**

**[1] ග්‍රෑන්ඩ් ප්‍රික්ස් (Grand Prix) සම්මානය (රටකට සහ කලාපයකට එක් ජයග්‍රාහකයෙකු බැගින්)**

**ජයග්‍රාහකයෙකු කුසලාන සහ සමරු පදක්කම් ලැබෙනු ඇති අතර ජපානයේ පැවැත්වෙන සම්මාන ප්‍රදානෝත්සවයට සහ සංස්කෘතික හුවමාරු වැඩසටහනකට ආරාධනා කරනු ලැබේ. (අනපේක්ෂිත සිදුවීම් සිදුවුවහොත්, සංවිධායකයින්ගේ තනි අභිමතය පරිදි සංචාරය අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට හැකි සහභාගිවන්නන්ට සමරු භාණ්ඩ ලැබෙනු ඇත.)**

**[2] සංවිධායකයින්ගේ සම්මාන**

**මිට්සුබිෂි මහජන කටයුතු කමිටු සම්මානය (Mitsubishi Public Affairs Committee Award) (රටකට සහ කලාපයකට එක් ජයග්‍රාහකයෙකු ) ජයග්‍රාහකයෙකු සම්මාන සහතික සහ සමරු තිළිණ ලැබේ.**

**යුනෙස්කෝ සමාජ සහ සංගම්වල ආසියානු පැසිෆික් සම්මේලනයේ සම්මානය (Asian Pacific Federation of UNESCO Clubs and Associations Award )**

**(රටකට සහ කලාපයකට එක් ජයග්‍රාහකයෙකු ) සම්මාන සහතික සහ සමරු තිළිණ ලැබෙනු ඇත..**

**ජපානයේ යුනෙස්කෝ සංගම් ජාතික සම්මේලනය සම්මානය (National Federation of UNESCO Associations in Japan Award)**

**(රටකට සහ කලාපයකට එක් ජයග්‍රාහකයෙකු )ජයග්‍රාහකයෙකු සම්මාන සහතික සහ සමරු තිළිණ ලැබෙනු ඇත.**

**(9) තෝරා ගැනීමේ ක්‍රමවේදය**

එක් එක් රටෙහි විධායක කමිටුව විසින් පළමු තෝරාගැනීම සිදු කරනු ලබන අතර ඉන් චිත්‍ර 4 ක් තෝරා ගනු ඇත. මෙම චිත්‍ර 4 ජපානයට යවනු ලබන අතර එහිදී ඒවා ජපානයේ ජාත්‍යන්තර පරීක්ෂණ කමිටුව විසින් විනිශ්චය කරනු ලැබේ. මේ ආකාරයට ජයග්‍රාහී " Illustrated Diaries " තෝරා ගනු ලැබේ.

* ජපානයට යවන ලද ඇතුළත් කිරීම් ආපසු ලබා නොදෙන බව කරුණාවෙන් සලකන්න. " Illustrated Diaries " හි අයිතිය සංවිධායකයින් සතුය .

**(10) තේරීම් නිර්ණායක**

**තේරීම් කමිටුව ඔබේ කලා කෘති හොඳද නැද්ද යන්න විනිශ්චය නොකරනු ඇත, නමුත් ඔබ ඔබේ සංස්කෘතිය, ඔබේ දෛනික ජීවිතය මෙන්ම ඔබේ හැඟීම් සහ සිතුවිලි නිරූපණය කරන ආකාරය දෙස බලනු ඇත.**

**තේරීම් නිර්ණායක:**

**[1] සංස්කෘතිය , ජාතික චරිත , දේශීය සිරිත් විරිත් , දේශීය ජීවිතය , දේශීය ස්වභාවය සහ පරිසරය වැනි රටට හෝ ප්‍රදේශයට අනන්‍ය වූ ලක්ෂණ චිත්‍රය කොතරම් දුරට පෙන්වයිද .**

**[2] චිත්‍රය දරුවාට අනන්‍ය වූ සංවේදීතාව හෝ දෘෂ්ටිකෝණ කොතරම් ප්‍රදර්ශනය කරයිද.**

**[3] චිත්‍රයේ සංකල්ප , ඉදිකිරීම් , පරිස්සම් බව යන වැඩ කටයුතු කොතරම් තිබේද.**

**[4] චිත්‍රයේ විවිධ මාතෘකා කොපමණ ආවරණය කරයිද.**

**(11) තේරීම් කමිටුව**

**[1] ජාතික තේරීම් කමිටුව (එක් එක් රට සහ කලාපය)**

**කමිටු ප්‍රධානියා :** අමිතා ඉන්දිරානි මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන) කලාප

කාර්යාලය. කැලණිය

**කමිටුවේ සාමාජිකයි:**

- **අනුපමා බණ්ඩාර මහත්මිය** නියෝජ්‍ය අධ්‍යක්ෂ **(සෞන්දර්ය** අධ්‍යාපන **පරිපාලන) කලාප** අධ්‍යාපන **කාර්යාලය, හෝමාගම**
- **ආචාර්ය අනුජා ද සිල්වා මහතා** – බහුවිධ මාධ්‍ය කලා අධ්‍යයන අංශ ප්‍රධානී, දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය
- **තනුජා අයගම මහත්මිය** – කතුවරිය, ලේඛිකාව, සංස්කාරකවරිය සහ ප්‍රකාශකවරිය
- **ලලිත් ලංසක්කාර මහතා** – ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය

**ඉහත සපයා ඇති උපදෙස් වලට අනුව නිර්මාණය කළ චිත්‍ර පහත සඳහන් ලිපිනයට තැපැල් කළ යුතුය.**

**ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසන් සභාව**

**05** වන මහල,

අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,

ඉසුරුපාය,

බත්තරමුල්ල.

**ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම්, කරුණාකර පහත සඳහන් දුරකතන අංකයෙන් අප හා සම්බන්ධ වන්න:**
**+94112177002**